Bs Accounting O/L

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2009 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2009

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I**
**வணிகக் கல்வியும் கணக்கீடும் I**
**Business and Accounting Studies I**

පැය එකයි
*One hour*

සැලකිය යුතුය :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවරුදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසදෙන කවය මත (**x**) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරිස්සමෙන් කියවන්න.

---

01. අවශ්‍යතාවක් වනුයේ,
i. කමිසය ii. ආහාර iii. පාවහන් iv. බත්

02. නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදවුමක් (නිෂ්පාදන සාධකයක්) වන්නේ,
i. අලෙවිකරණය ii මුල්‍ය හා ගිණුම්කරණය
iii. පරිපාලනය iv. ව්‍යවසායකත්වය

03. පවුල් සංයුතිය, අධ්‍යාපන මට්ටම, ස්ත්‍රී පුරුෂ බව, ප්‍රාදේශීය ලක්ෂණ, වයස් ව්‍යුහය ආදි සාධක අදාල වන ව්‍යාපාර පරිසරය වන්නේ,
i. ගෝලීය පරිසරය ii. සමාජ හා සංස්කෘතික iii. තාක්ෂණික iv. ප්‍රජා

04. වෙළෙඳාමේ මූලාරම්භය වනුයේ,
i. මිල ක්‍රමය ii. භාණ්ඩ හුවමාරුව iiii. මුදල් භාවිතය iv. චක්‍ර නිෂ්පාදනය

05. අවතැන්වූ ජනතාව වෙනුවෙන් නිවාස, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අයත් වන්නේ,
i. ප්‍රාථමික නිෂ්පාදන කර්මාන්තයට ය. ii. ද්විතියික නිෂ්පාදන කර්මාන්තයට ය.
iii. තෘතියික නිෂ්පාදන කර්මාන්තයට ය. iv. පෙරළුම් කර්මාන්තයට ය.

06. විකුණුම්කරු ගැණුම්කරු පිළිබඳ තොරතුරු දැන ගත යුතු වන්නේ,
i. අත්පිට මුදලට විකිණීමේ දී ii. ණයට විකිණීමේ දී
iii. අත්පිට හා ණයට විකිණීමේ දී iv. ඉහත කිසිවක් නොවේ.


07. ශ්‍රී ලංකා ජාතික තත්ව සම්මානය පිරිනමන ආයතනය වන්නේ,
i. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ii. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
iii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය iv. ජාතික ශිල්ප සභාව.


08. ප්‍රමුඛ බැංකුවේ තැන්පත්කරුන් ආරක්ෂා කිරීම හා නව ව්‍යාපාර කටයුතු සඳහා අලුතින් ආරම්භ කර අනුයුක්ත කර ඇති බැංකුව වන්නේ,
i. ජාතික සංවර්ධන බැංකුව ii. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
iii. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව iv. ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

09. රජය ව්‍යාපාර සඳහා නීතිරීති පැනවීම අරමුණක් නොවන්නේ,
i. අසාධාරණ තරගකාරීත්වයෙන් ව්‍යාපාර ආරක්ෂා කිරීම.
ii. ව්‍යාපාර විෂමාචාර වලින් සමාජය ආරක්ෂා කිරීම.
iii. නුසුදුසු අනාරක්ෂිත භාණ්ඩ හා සේවා අපනයනය වැළැක්වීම.
iv. අසාධාරණ ව්‍යාපාර පරිචයන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.

10. ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සාධක කාණ්ඩය වන්නේ,
i. වේගය, බලය, ධාරිතාව, මාධ්‍යය. ii. පිරිවැය, මාර්ගය, ආරක්ෂාව, සුලභත්වය.
iii. පිරිවැය, ධාරිතාව, බලය, ආරක්ෂාව iv. පිරිවැය, ආරක්ෂාව, වේගය, ධාරිතාව.


11. චෙක්පත අතිනත පැවරීමට බාධාකාරි වන රේඛණය වන්නේ,

i.



ii.



iiii.



iv.



12. ආනයනය කරනු ලැබූ භාණ්ඩ වරායෙන් පිටතට ගෙනවුත් නැවත සකස් කර හෝ නොකර අපනයනය කිරීම,
i. ප්‍රති අපනයනයයි ii. අන්තරාල වෙළෙඳාමයි
iiii. අපනයනය iv. ආනයනය.

13. අපනයනයකරුගේ භාණ්ඩවල අයිතිය ප්‍රකාශ කිරීම සඳහා ඉදිරිපත් කලහැකි ලියවිල්ල වන්නේ,
i. නෞභාරපත ii. ඉන්වොයිසිය iii. රක්ෂණ සහතිකය iv. ප්‍රභවස්ථාන සහතිකය

14. ජීවිත රක්ෂණය සඳහා බලපාන රක්ෂණ මූලධර්මය මින් කුමක්ද?
i. දායකත්වය ii. ආදේශනය iii. ආසන්නතම හේතුව iv. උපරිම විශ්වාසය

15. සීමිත පොදු සමාගමක හා සමුපකාර ව්‍යාපාරයක අවම අධ්‍යක්ෂකවරු ගණන පිළිවෙලින් අයත් පිළිතුර වන්නේ,
i. 1 හා 2 කි. ii. 2 හා 7 කි. iii. 2 හා 3 කි. iv. 1 හා 7 කි.

16. සමුපකාර සමිතියක් ලියාපදිංචිය සඳහා අවශ්‍ය නොවන ලියවිල්ල වන්නේ,
i. සමිතියේ අතුරු ව්‍යවස්ථාව ii. ව්‍යවස්ථාපිත ප්‍රකාශය
iii. සමිතිය පිහිටුවීමේ යෝග්‍යතාව පිළිබඳ වාර්තාව iv. පැවති රැස්වීම් වාර්තා පිටපත්.

17. සමුපකාර සමිති ලියාපදිංචි සිදුකරන ආයතනය වන්නේ,
i. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය ii. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
iii. සමුපකාර සේවක කොමිෂන් සභාව iv. සමුපකාර කළමණාකරණ ආයතනය.

18. "පි. පෙරේරා හෝ රැගෙන එන්නාට රු. දස දහසක් පමණක් ගෙවනු" යනුවෙන් චෙක්පතක සඳහන් වුවහොත් එය කුමන් වර්ගයේ චෙක්පතක් ද ?
i. විධාන චෙක්පතකි ii. රේඛිත චෙක්පතකි iii. ධාරක චෙක්පතකි iv. විකල චෙක්පතකි

19. නෛතික පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
i. රාජ්‍ය සංස්ථා ii. සී/ස පෞද්ගලික සමාගම්
iii. හවුල් ව්‍යාපාර iv. සමුපකාර

20. ගබඩාකරණ ක්‍රියාවලියේ අංගයක් නොවන්නේ,
i. ගබඩාවට භාණ්ඩ ඇණවුම් කිරීම ii. තොග ලබා ගැනීම
iii. ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීම iv. නිකුත් කල භාණ්ඩ සඳහා මුදල් ලබා ගැනීම.

21. වාණිජ බැංකුවක කාර්යයක් නොවන්නේ,
i. තැන්පතු භාර ගැනීම හා පවත්වාගෙන යාම ii. අයිරා පහසුකම් සැපයීම
ii. ණයවර ලිපි නිකුත් කිරීම iv' ව්‍යවහාර මුදල් නිකුත් කිරීම.

22. රු. 1,000 වටිනා කාර්යාල ලිපිද්‍රව්‍ය තොගයක් ගින්නෙන් විනාශ විය. මෙය මූලික ගිණුම්කරණ සමීකරණයේ කවර සංරචක වලට බලපෑම් කරයි ද?
i. වත්කම් වලට පමණි ii. වත්කම් හා වගකීම් වලට ය.
iii. වත්කම් හා ප්‍රාග්ධනයට ය. iv. ප්‍රාග්ධනය හා වගකීම් වලට ය.

23. විකුණුම් ජ'නලයේ සටහන් කරනු ලබන්නේ,
   i. නැවත විකිණීමේ පරමාර්ථයෙන් ගත් භාණ්ඩ ණයට විකුණු විටදී ය.
   ii. නැවත විකිණීමේ පරමාර්ථයෙන් භාණ්ඩ ණයට ගත් විටදී ය.
   iii. නැවත විකිණීමේ පරමාර්ථයෙන් ගත් භාණ්ඩ ගින්නෙන් විනාශ වු විටදී ය.
   iv. නැවත විකිණීමේ පරමාර්ථයෙන් ගත් භාණ්ඩ ආපසු හරවා යැවු විටදී ය.

❖ පහත සඳහන් ගනුදෙනු ආශ්‍රයෙන් ප්‍රශ්ණ අංක 24 හා 25 සඳහා පිළිතුරු සපයන්න.
   A මුදලින් රු. 10,000 ප්‍රාග්ධනය ලෙස යෙදීම.
   B රු. 1,000 ලී බඩු මිලට ගැනීම.
   C රු. 500 භාණ්ඩ රු. 750 ණයට විකිණීම.
   D රු. 50,000 බැංකු ණයක් ලබා ගැනීම

24. වත්කම් හා ප්‍රාග්ධනය යන සංරචක වලට බලපෑම් කරන ගනුදෙනු වන්නේ,
   i. A, B    ii. A, C    iii. A, D    iv. D, C

25. වත්කම් වලට පමණක් බලපෑම් කරන ගනුදෙනුව වන්නේ,
   i. A    ii. B    iii. C    iv. D

26. රු. 1,000 දුන් වට්ටම් ලද වට්ටම් ගිණුමේ සටහන් කිරීමේ වරද නිවැරදි කිරීමේ ජ'නල් සටහන වන්නේ,
   i. දුන් වට්ටම් හර රු. 1,000 ලද වට්ටම් බැර රු. 1,000
   ii. දුන් වට්ටම් හර රු. 1,000 ලද වට්ටම් හර රු. 1,000 අවිනිශ්චිත ගිණුම බැර රු. 2,000
   iii. ලද වට්ටම් හර රු. 1,000 දුන් වට්ටම් බැර රු. 1,000
   iv. අවිනිශ්චිත හර රු. 2,000 දුන් වට්ටම් බැර රු. 1,000 ලද වට්ටම් බැර රු. 1,000

27. පාවහන් නිෂ්පාදන සමාගමක පාවහන් යුගලයක විකුණුම් මිල රු . 440 ක් විය. 10% ලාභයක් එක් පාවහන් යුගලයකින් ලැබෙන සේ විකුණුම් මිල නියම කළ අතර වර්ෂය තුළ පාවහන් යුගල 1000 නිපදවන ලදී. පාවහන් වල මුළු පිරිවැය කියද ?
   i. රු. 464,000    ii. රු. 396,000    iii. රු. 400,000    iv. රු. 488,000

28. යම් කාලච්ඡේදයක් තුළ ප්‍රයෝජනයට ගත් මුළු සෘජු අමුද්‍රව්‍ය වෙනුවෙන් වැය වී ඇති මුදල,
   i. නිෂ්පාදන පිරිවැය    ii. පාරිභෝජන ද්‍රව්‍ය පිරිවැය.
   iii. ප්‍රාථමික පිරිවැය    iv. පොදු කාර්ය පිරිවැය.

29. තැන්පත් කළ චෙක්පතක් අගරු වී ඇති විට ද්විත්ව සටහන වන්නේ,
   i. බැංකු තිරුව හර    අගරු වු චෙක්පත් ගිණුම බැර
   ii. බැංකු තිරුව බැර    ණයගැති ගිණුම හර
   iii. බැංකු තිරුව බැර    අගරු වු චෙක්පත් ගිණුම හර
   iv. බැංකු තිරුව බැර    ණයහිමි ගිණුම හර

30. ශේෂ පිරික්සුමෙන් හෙලිදරව් නොවන වරද දක්වන්න.
   i. රු. 10,000 විකුණුම්, විකුණුම් ගිණුමේ සටහන් නොවීම.
   ii. රු. 200 ලිපිද්‍රව්‍ය, ලිපිද්‍රව්‍ය වියදම් ගිණුමේ බැරට සටහන් කිරීම.
   iii. රු. 500 විදුලි වියදම් මුදලින් ගෙවීම, විදුලි වියදම් ගිණුමේ රු. 400 ලෙස දැක්වීම.
   iv. රු. 1,000 ගැණුම් ඉන්වොයිසියක් දෙවරක් සටහන් කිරීම.

31. ආපසු එවුම් ජ'නලයේ සටහන් කර ඇති ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේ දි සටහන් කල යුතු ආකාරය වන්නේ,
   i. ආපසු එවුම් ගිණුම හර, ණයහිමි ගිණුම බැර    ii. ආපසු එවුම් ගිණුම් බැර, ණයගැති ගිණුම හර
   iii. ආපසු එවුම් ගිණුම හර, ණයගැති ගිණුම බැර    iv. ආපසු එවුම් ගිණුම බැර, ණයහිමි ගිණුම හර

32. රු. 700 ගැණුම් ඉන්වොයිසිය රු. 70 ලෙස ගිණුම් වල දැක්වීමේ වරද නිවැරදි කිරීමේ ජ'නල් සටහන වන්නේ,
   i. ගැණුම් ගිණුම බැර රු. 603, අවිනිශ්චිත ගිණුම හර රු. 603
   ii. ගැණුම් ගිණුම හර රු. 630, අවිනිශ්චිත ගිණුම බැර රු. 630
   iii. ගැණුම් ගිණුම හර රු. 630, ණයහිමි ගිණුම බැර රු. 630
   iv. ගැණුම් ගිණුම බැර රු. 630, අවිනිශ්චිත ගිණුම හර රු. 630

33. රජරට සහල් ව්‍යාපාරය රු. 100, 000කට සහල් පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් මිලටගත් අතර ඒ සඳහා මුදල් ගෙවීමේ දී රු. 5000 ක මුදලක් අඩුකර ඇත. මෙම ව්‍යාපාරයේ ගිණුම් ලිපිකරු පොත් වල වාර්තා කල යුතු වටිනාකම වන්නේ,

i. රු. 95,000 හා රු. 5,000 පමණි
ii. රු. 100,000 හා රු. 5,000 පමණි
iii. රු. 95,000 පමණි.
iv. රු. 100,000 පමණි.

❖ ප්‍රශ්ණ අංක 34 හා 35 සඳහා පහත කොටස කියවා ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

2009.01.31 දිනට මුදල් පොතේ වාසිදායක ශේෂය රු. 30,000 වන අතර එය බැංකු ප්‍රකාශණයේ ශේෂය සමග සමාන නොවිය. අසමානතාවයට හේතු පහත පරිදි සොයා ගන්නා ලදි.

A - ලද ලාභාංශ රු. 5,000 මුදල් පොතේ නොදැක්විණි.
B - නිත්‍ය නියෝග මත ගෙවීම් රු. 2,000 මුදල් පොතේ නොවිය.
C - තැන්පත් කළ නමුත් නිශ්කාශණය නොවු චෙක්පත් රු. 7,000
D - නිකුත් කළ නමුත් ගෙවීමට මෙතෙක් බැංකුවට ඉදිරිපත් නොවු චෙක්පත් රු. 5,000
E - බැංකුව වැරදීමකින් බැර කළ අගය රු. 2,000

34. මුදල් පොතේ සංශෝධිත ශේෂය වන්නේ,

i. රු. 27,000 ii. රු. 33,000 iii. රු. 35,000 iv. රු. 31,000

35. බැංකු ප්‍රකාශණයට අනුව ශේෂය,

i. රු. 29,000 ii. රු. 37,000 iii. රු. 33,000 iv. රු. 31,000

36. ගොඩනැගිලි කුලි රු. 3,500 ක් ගෙවීම, අදාළ ගිණුම් දෙකේ ම හර පැත්තේ සටහන් කිරීම නිසා ශේෂ පිරික්සුමට ඇති වන බලපෑම වන්නේ,

i. ශේෂ පිරික්සුමේ හර පැත්ත රු. 7,000 ක් වැඩිවිම.
ii. ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු. 7,000 ක් අඩුවිම.
iii. ශේෂ පිරික්සුමේ හර පැත්ත රු. 3,500 ක් වැඩිවිම.
iv. ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු. 3,500 ක් වැඩිවිම.

37. ද්විත්ව තිරු මුදල් පොතේ බැර පැත්තේ බැංකු තිරුවේ ඉදිරියට ගෙනා ශේෂයක් ඇත්නම් එයින් අදහස් කරන්නේ,

i. ජංගම ගිණුමේ මුදල් ශේෂය
iv. අදාළ කාලය සඳහා ජංගම ගිණුමෙන් ලබා ගත් මුදල
iii. බැංකුවෙන් ගත් අයිරා ප්‍රමාණය
iv. බැංකු ගිණුමේ තැන්පත් කල මුදල

38. මුදල් වට්ටම් අඩු කරනු ලබන්නේ,

i. අත්පිට මුදලට බඩු ගන්නා විට.
ii. ගිවිස ගත් කාලය තුළ ගෙවීම් කරන විට
iii. බඩු මිලට ගන්නා අවස්ථාවේ දීම චෙක්පතකින් ගෙවීම් කරන විට.
iv. බඩු මිලට ගන්නා අවස්ථාවේ දීම මුදලින් හෝ චෙක්පතකින් ගෙවීම් කරන විට.

39. පහත සඳහන් බැර ශේෂයන් අතරින් දැකි හැකි අසාමාන්‍ය අයිතමය කුමක් ද?

i. පොලි ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම.
ii. ණයගැතියකුගේ ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම.
iii. ආපසු යැවුම් ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම.
iv. ලද වට්ටම් ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම.

40. ගිණුම්කරණ වාර්තා පිළිබඳව කළමණාකරුවන් උනන්දුවක් දැක්වීමට හේතුව වන්නේ,

i. එසේ කිරීමට ඔවුන්ට අයිතිකරුවන්ගෙන් උපදෙස් ලැබී ඇති නිසා
ii. ව්‍යාපාරයේ වගකිව යුතු ප්‍රධානීන් වන්නේ කළමණාකරුවන් නිසා
iii. රජය පනවන නිති රීති වලට අනුකුලව කලමණාකරුවන් ක්‍රියා කළ යුතු නිසා
iv. තිරණ ගැනිමට අවශ්‍ය දත්ත ගිණුම්කරණ වාර්තා වලින් ලබා දෙන නිසා.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර විසින් සම්පාදිත යි.